// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1907/19 - 2015 මාර්තු මස 25 වැනි බදාදා - 2015.03.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2015 මාර්තු මස 26 වැනි දින සිට ආරම්භ වන මාස 04ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2015.01.22 දිනැති අංක 1898/43 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් සහල් (සංයෝජිත වර්ගීකරණ අංක 10.06) සඳහා ප්‍රකාශිත අදාළ නියමයන් 2015 මාර්තු මස 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

රවි කරුණානායක,<br>
මුදල් අමාත්‍ය.

2015 මාර්තු මස 25 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 1. | 10.06 | 1006.10 | පොතු සහිත සහල් (වී හෝ රළු ලෙස) | කි.ග්‍රෑමයකට රු. 40.00 |
| | | 1006.20 | දහයියා ඉවත් කළ (දුඹුරු) සහල් | කි.ග්‍රෑමයකට රු. 40.00 |
| | | 1006.30 | පාහින ලද හෝ ඔප දමන ලද හෝ නොලද සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටු සහල් | කි.ග්‍රෑමයකට රු. 40.00 |
| | | 1006.40 | කැඩුණු සහල් | කි.ග්‍රෑමයකට රු. 40.00 |

04 -334

1A - PG 2414 — 502 (2015/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*